## සේයා පටල නොමැති සේයා රූ කලාව

# ඩිජිටල් ජායාරූපකරණය

**ශ්‍රී ට අවුරුදු කීපයකට පෙර මාගේ මිතුරකු විදේශයක සිට පැමිණ මා හමුවේ කියා සිටියේ එම රටේදී සේයා පටල භාවිතා නොකරන කැමරාවකින් ජායාරූප ගත් බවක් එම ජායාරූප නැවතත් කැමරාවෙන්ම නැරඹු බවත්ය. නමුත් මා එය කෙසේවත් විශ්වාස නොකළේය. නමුත් මා විශ්වාස නොකළ සේයා පටල ද භාවිතයට නොගන්නා ඒ කැමරා ඩිජිටල් කැමරා නමින් දැන් දැන් මෙරට ආක්‍රමණය කරමින් සිටි.**




සේයා පටල නොමැතිව ජායාරූප ගන්නා අන්දමත්, එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව මා තුළවූ කුකුසත් සංසිඳවූයේ මෙරටට ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීමේ පුරෝගාමියකු වන චාමිකර ගොඩමාන්න මහතායි. මා ඔහුගෙන් ඇසූ මුල්ම පැනය වූයේ ඩිජිටල් කැමරාවක් යනු කුමක්ද යන්නයි.

"සරල ලෙස අර්ථ දැක්වූවහොත් ඩිජිටල් කැමරාව යනු සේයා පටල යොදා නොගෙන වෙනත් තාක්ෂණයක් ඔස්සේ ජායාරූප ගබඩා කර තබා ගන්නා විශේෂිත වූ කැමරාවකටයි. දැන් ඔබට ප්‍රශ්නයක් විය හැකියි. කෙසේද කැමරාවෙන් ලබාගන්නා ජායාරූප ගබඩා කරගන්නේ කියා. ඊට පෙර බලමු, අප දැනට භාවිතා කරන සාමාන්‍ය කැමරාවක් දිහා. එහි කාචයෙන් එන ආලෝක කදම්බ ඇතුළත ඇති සේයා පටලය රසායන ප්‍රතික්‍රියාවකට භාජනය කිරීමෙන් ඔබ දැක ඇති ඍන පටල සෑදෙයි."




"නමුත් ඩිජිටල් කැමරාවක සේයා පටල භාවිතා නොකරන නිසා මීට වඩා වෙනස් මුහුණුවරක් ගන්නවා. මෙම කැමරාවක ඇති වටිනාම දෙය තමා එය තුළ සවිතර ඇති CCDනම් කුඩා ඉලෙක්ට්‍රොනික් චීපය මෙම චීපය මගින් කෙරෙනුයේ කැමරාවේ කාචය හරහා එන ආලෝක කදම්බ



**චාමිකර ගොඩමාන්න**
**අධ්‍යක්ෂක**
**නයින්හාට් ආයතනය**

මෙම චීපය මත පතිත වීමෙන් පසු ඒවා ඩිජිටල් සංඛ්‍යාත බවට හරවා කැමරාවේ ඇති මෙමරි කාඩ් පත මත තැන්පත් කිරීමයි.

මොකක්ද මේ මෙමරි කාඩ්පත

"මෙමරි කාඩ්පත කියන්නේ කැමරාවේ CCDඑක මගින් ලබා ගන්නා දත්ත තැන්පත් කරන කුඩා හතරැස් පැතලි තැටියක් වැනි උපකරණයකටයි. සරල ලෙස පැවසුවහොත් පරිඝණකයෙහි ඇති හාඩ් ඩිස්ක් එක්ක දත්ත තැන්පත් කිරීම වගෙයි. මෙය කුඩා හාඩ් ඩික්ස් එකක් වැනියයි කිව්වොත් වරදක් නැහැ. මෙම මෙමරි කාඩ් පත් වර්ග කීපයකින් හා විවිධ ධාරිතාවන්ගෙන් ලබාගත හැකියි.

1. SMART MEDIA
2. COMPACT FLASH
3. SMART STIKS
4. SD CARD

යන ඒවා බොහෝ කැමරා සඳහා යොදා ගනී. මෙම කාඩ් පත්වල ධාරිතාවයන් 8M Bසිට ඉහළට එනම්, 1GBදක්වා විහිදී තියෙනවා. තාක්ෂණය දියුණුවීමත් සමගම මේවායේ ප්‍රමාණය කුඩාවෙමින්ද





**4 x Digital Zoom මගින් විශාලනය කර ඇති ඡායාරූපයක්**

ධාරිතාව වැඩිවෙමින් ද නිෂ්පාදනය වී තිබෙනවා.

**මෙම මෙමරි කාඩ්පත් ඕනෑම කැමරාවක පාවිච්චි කළ හැකිද ?**

ඒ ඒ කැමරා වර්ග අනුව එහි ඇතුළත් කළ හැක්කේ කුමන වර්ගයේ කාඩ්පත්ද යන්න කැමරා නිෂ්පාදකයන් විසින් දක්වා තිබෙනවා. උදාහරණයක් වශයෙන් Smart Mediaකාඩ් පත් භාවිතා කළ හැක්කේSONYකැමරා සඳහා පමණයි. නමුත් සමහර කැමරා මෙමරි කාඩ් වර්ග දෙකක් භාවිතා කළ හැකි ලෙස සකසා තියෙනවා. කැමරාවක් මිළදී ගැනීමට පෙර එහි භාවිතා කළ හැක්කේ කුමන වර්ගයේ කාඩ් පත්ද එම කාඩ්පත් මෙරට වෙළඳ පොළෙන් පහසුවෙන් ලබාගත හැකිද යන්නත් එහි මිල පිළිබඳවත් සොයා බැලිය යුතු වෙනවා.



CCD චීපයක්

මෙම මෙමරි කාඩ් පත්වල සුවිශේෂී ගුණයක් වන්නේ තැන්පත්ව ඇති ඡායාරූප මකා දමා නැවත නැවතත් ඕනෑම වාරයක් ඡායාරූප තැන්පත් කළ හැකි වීමයි. එම නිසා සේයා පටල භාවිතයේ මෙන් වරින් වර අළුතෙන් කාඩ්පත් මිලදී ගත යුතු වන්නේනැහැ. දීර්ඝකාලීනව බැලුවහොත් මෙය විශාල වාසියක්. 128 MBවැනි ඉහළ ධාරිතාවකින් යුත් කාඩ්පතක් සවි කරගත්තේ නම් මකා දැමීමකින් තොරව එකවර විශාල ඡායාරූප සංඛ්‍යාවක් ගබඩා කරගත හැකි වෙනවා.මෙහි ඇති තවත් වාසියක්නම් කලක් ගිය පසු සේයා පටල වලට සිදුවන පූස් බැඳීම්, වර්ණය වෙනස් වීම් වැනි ආපදාවලින් තොරව අවුරුදු ගණනකටද පසුවද මුල් ඡායාරූපයේ මෙන් කිසිදු වෙනසකින් තොරව පිටපත් ලබා ගැනීමට ඇති හැකියාවයි.

**මෙම මෙමරි කාඩ් පතකින් එකවර ගත හැකි ඡායාරූප සංඛ්‍යාව සීමිතයි කියන්නේ ඇත්තද ?**

එය තීරණය වන්නේ ප්‍රධාන වශයෙන් කාඩ් පතේ ධාරිතාව මතයි. එමෙන්ම ගන්නා පින්තූරයේ විභේදනය (Resolution) මතත් කැමරා වර්ගය මතත් එය වෙනස් වෙනවා. උදාහරණයක් වශයෙන් එක් කැමරා වර්ගයකින් එහි උපරිම විභේදනය සහිතව ලබාගත හැක්කේ ඡායාරූප 8 ක් පමණක් නම් වෙනත් වර්ගයක කැමරාවක උපරීම විභේදනය සහිතව ගත හැක්කේ එක් ඡායාරූපයක් පමණක් වන්නට පුළුවන.

**මේ විභේදනය ගැන තවදුරටත් කරුණු පැහැදිලි කරන්න පුළුවන්ද ?**

ඕනෑම ඡායාරූපයක් සෑදී තිබෙන්නේ සියුම් තිත් වැනි අංශු වලින් ඡායාරූපයක ඇති තිත් ප්‍රමාණය මනිනු ලබන ඒකකය තමයි විභේදනය(Resolution)කැමරාවක ඇති ගුණාත්මක භාවයට මෙම විභේදනය තදින් බලපානවා. ඉතා පැහැදිලිතාවයකින් යුත් ඡායාරූප



**ඩිජිටල් කැමරාවත්, ජංගම දුරකතනයත් එක්වී ඇති අයුරු**

# Top Ten

ලොව සුපතල RC WORLD සඟරාව මගින් ලොව හොඳම ඩිජිටල් කැමරා දහය ලෙස නම් කර ඇති කැමරා දහය මෙන්න.

**1. Canon Power Short S 50**

උපරීම විභේදනය 5 Mega (2592 + 1994)

මෙහි මෙමරිධාරිතාව - 32MB

පින්තූරවල තත්ත්වය - හොඳයි මිල ඇ.ඩො.600/-

**2. Olmpvs C - 5050 Zoom**

විභේදනය - 5 M.P (2560 - 1920)

මෙමරි ධාරිතාව - 32MB

පින්තූරවල තත්වය - හොඳයි මිල ඇ.ඩො.500/-

**3. Nikon Coolpix 4300**

උ: විභේදනය - 4 M.P (2272 - 1704)

මෙමරි ධාරිතාව - 16MB

පින්තූරවල තත්වය - හොඳයි මිල - ඇ.ඩො.500/-

**4.SONY CYBER - SHORT DSC - F - 717**

උ: විභේදනය 5.M.P (2560 - 1920)

මෙමරි ධාරිතාව - 32MB

පින්තූරවල තත්වය - හොඳයි මිල - ඇ.ඩො.700/-

**5.Fuji Film Fine pix $ 602**

උ : විභේදනය - 3.1 MP (2048 - 1536)

මෙමරි ධාරිතාව - 16MB

පින්තූරවල තත්වය - ඉතා හොඳයි මිල - ඇ.ඩො.1500/-

**6.Olympvs E - ZON**

උ: විභේදනය 5MP (2560 - 1920)

මෙමරි ධාරිතාව - 32MB

පින්තූරවල තත්වය - ඉතා හොඳයි මිල - ඇ.ඩො.1200/-

**7.Nikon Cool Pix 5700**

උ:විභේදනය 5 MP (2560 - 1920)

මෙමරි ධාරිතාව - 16MB

පින්තූරවල තත්වය - ඉතා හොඳයි මිල - ඇ.ඩො.1500/-

**8.Canon Eos 10D**

උ: විභේදනය 6.3 M.P

මෙමරි ධාරිතාව - 16MB

පින්තූරවල තත්වය - ඉතා හොඳයි මිල - ඇ.ඩො.1500/-

**9.Contax TVS Digital**

උ: විභේදනය - 5 M.P

මෙමරි ධාරිතාවය - - 16MP

පින්තූරවල තත්වය - හොඳයි මිල - ඇ.ඩො.1000/-

**10.Leica Digilux**

උ: විභේදනය - 3.9 M.P

මෙමරි ධාරිතාවය - 64MB

පින්තූරවල තත්වය - හොඳයි මිල - ඇ.ඩො.745/-

මෙම කැමරා පිළිබඳ වැඩි විස්තර PC WORLD COM යන වෙබ් අඩවියට පිවිසීමෙන් බලාගත හැකියි.

ගැනීමට කැමරාවේ තිබෙන උපරිම විභේදනය ප්‍රයෝජනයට ගතයුතු වෙනවා. මිල අඩු කැමරාවල උපරිම අගය 640 - 480 වැනි අගයක් ගන්නා අතර මිල අධික තත්ත්ව-යෙන් උසස් කැමරාවන්හි එම අගය 2048 - 1530 වැනි අගයක් හෝ ඊටත් වඩා වැඩි අගයක් ගන්නවා. ජායාරූප විශාල කර මුද්‍රණ කිරීමේ දී කැමරාවක තියෙන මෙම උපරිම අගය ඉතා වැදගත් වන අතර අඩු අගයක් සහිතව ගත් ජායාරූප විශාල කිරීමේ දී බොඳවීම් වැනි පෙනුමක් ලැබෙනවා.මෙම අගය ඉහළ මට්ටමේ තිබෙන කැමරාවක් කැමරාවේ ඉදිරිපස සඳහන් කර තිබෙනMegapixelවල අගය මගින් බලාගත හැකියි.

**මෙම ඩිජිටල් කැමරාවක් මිලදී ගැනීමේ දී සලකා බැලිය යුතු අනිකුත් විශේෂාංග මොනවාද ?**

බොහෝ ඩිජිටල් කැමරාවල පිටුපස කුඩා LCDතිරයක් දක්නට ලැබෙනවා. නමුත් සමහර අඩු මිල කැමරාවල මෙමLCDතිරය දක්නට නැහැ. නමුත් මෙමLCDතිරය අපට බොහෝ ප්‍රයෝජනවත් වෙනවා. මක් නිසාද යත්, අප ගන්නා ජායාරූපයක හොඳ නරක එම මොහොතේම බලාගත හැකි වීම නිසයි. අනවශ්‍ය ජායාරූපයක් නම් එය එවලේම මකා දමා නැවතත් ගත හැකියි. මෙම LCDතිරය සඳහා විශාල ලෙස බලය අවශ්‍ය බැවින් නිතරම මෙම LCDතිරය දෙස බලා ජායාරූප ගැනීමෙන් බැටරිවල බලය ශීඝ්‍රයෙන් අඩුවීමට ඉඩ තිබෙනවා. එම නිසා අවශ්‍ය නම් පමණක්LCDතිරය ප්‍රයෝජනයට ගත යුතුයි.

## ඩිජිටල් කැමරාවක් මිලදී ගැනීමට පෙර මේ ගැනත් හිතන්න

1. සාමාන්‍ය පාවිච්චියට නම් 2 Mega Pixel සහිත කුඩා කැමරාවක් මිලදීගන්න.
2. ඔබ වෘත්තිය ජායාරූප ශිල්පියකු නම් අවම වශයෙන් 4 MPහෝ ඊට වැඩි කැමරාවක් මිලදී ගන්න.
3. විශාලනය (Zoom)කිරීමේ පහසුකම් තිබේදැයි බලන්න.
4. Optical Zoom පහසුකම තිබේනම් වඩාත් හොඳයි.
5. අවම වශයෙන් Digital Zoom ඇති කැමරාවක් මිලදී ගන්න.
6. LCDපැනලය තිබේදැයි බලන්න.
7. අතිරේක මෙමරි කාඩ් ඇතුල් කළ හැකිදැයි බලන්න.
8. කැමරාවට සරිලන මෙමරි කාඩ්පත පහසුවෙන් හා ලාබෙට ලබා ගත හැකිදැයි විමසා බලන්න.
9. කැමරාවක වැදගත්ම දෙය CCDචිපය බැවින්, එහි සවිකර ඇති CCDචිපයේ තාක්ෂණය ගැන සැලකිලිමත්වන්න.

තවත් සලකාබැලිය යුතු කරුණක් නම් එහි කාචය මගින් විශාල කිරීමේ(Zoom)පහසුකම තිබේද යන්නයි. මෙම විශාලනය කිරීම ඩිජිටල් කැමරාවකින් ක්‍රම දෙකකට කළ හැකියි. දනට සාමාන්‍ය කැමරාවෙන් පවතින ඔප්ටිකල් (Optical)සූම් කිරීම එක් ක්‍රමයකි. අනෙක් ක්‍රමය




**විවිධ වර්ගයේ මෙමරි කාඩ්**



**සමහර කැමරාවල මෙමරි කාඩ් වර්ග කීපයක් ඇතුළත් කළ හැකියි**

නම් ඩිජිටල් (Digital)සූම් ක්‍රමයයි.ඔප්ටිකල් සූම් ක්‍රමය මගින් කෙරෙනුයේ කැමරාවේ කාචය ඉදිරියට තල්ලුවීමෙන් ජායාරූපය ග්‍රහණයට ගන්නා ක්‍රමයකි. නමුත් ඩිජිටල් සූම් කිරීමේ දී කාචයේ බලපෑමක් ඇති නොවෙයි.

මෙම ඩිජිටල් සූම් කිරීම යනු ගන්නාලද ජායාරූපයේ විභේදනය වැඩි කිරීම මගින් කෘතිමව ඇති කරන විශාල කිරීමකි. එම ඩසා ඔප්ටිකල් සූම් සහිත කැමරාවක් මිලදී ගැනීම නුවණට හුරුයි. බොහෝ උසස් කැමරාවල මෙම ක්‍රම දෙකම ඇති අතර මිල අඩු කැමරාවල ඇත්තේ ඩිජිටල් සූම් කිරීමේ පහසුකම් පමණි. සමහර කැමරාවල මෙම පහසුකමවත් නොමැති නිසා අඩු තරමේ ඩිජිටල් සූම් කිරීමේ පහසුකම් සහිත කැමරාවක්වත් මිලදී ගන්න.

අඩු ආලෝක තත්ත්වයන් යටතේ ක්ෂණික ලෝක(Flash)භාවිතයෙන් තොරව ජායාරූප ගැනීමට හැකි පහසුකම්ද ඩිජිටල් කැමරාවල

## ඩිජිටල් කැමරා පාවිච්චියේදී ඇති වාසි සහ අවාසි

### වාසි

1. සේයා පටල භාවිතයක් නැති නිසා ඒ සඳහා යන වියදම ඉතිරිවීය.
2. ගත් ජායාරූපයේ හොඳ නරක එවලේම බලාගත හැකිවීම
3. නුසුදුසු ජායාරූප එම මොහොතේම මකාදමා නැවත ගත හැකිවීම
4. තමන් සතුව පරිඝනකයක් ඇත්නම් ජායාරූපවල තත්වය තමන්ටම වැඩි දියුණු කරගත හැකිවීම
5. මෙමරි කාඩ්පතේ ධාරිතාවය ඉක්මවා ජායාරූප ගැනීමට අවශ්‍ය වුවහොත් ගත් ජායාරූප පරිගනකයකට භාගත කර නැවත එම කාඩ්පත‍ම පාවිච්චි කළ හැකිවීම
6. වීඩියෝ කැමරාවකින් තොරව කෙටි වීඩියෝ චිත්‍රපට පටිගත කර ගත හැකිවීම.
7. ලබාගත් ජායාරූප ලෝකයේ ඕනෑම තැනකට එම මොහොතේම ඊ මේල් මගින් යැවීමේ පහසුව.
8. සැහැල්ලු බව - හුරු බුහුටි බව මෙන්ම සාක්කුවක දමා රැගෙන යාමට ඇති පහසුව.

### අවාසි

1. ජායාරූප මුද්‍රණය සඳහා විශාල කිරීමේ දී යම් අපහැදිලිතාවයක් ඇතිවීම (අඩු විභේදනය සහිත කැමරා වලදී)
2. අධික විභේදනය සහිත කැමරා මිලෙන් අධිකවීම.
3. බැටරි වල බලය අධික ලෙස ක්ෂයවීම
4. ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර ලංකාවේ සෑම තැනම ප්‍රචලිතවී නොතිබීම.
5. ඩිජිටල් මුද්‍රණයේ දි තරමක ඉහළ මිලක් අයකිරීම.
6. සමහර කැමරා සඳහා අතිරේක මෙමරි කාඩ් ඇතුළත් කිරීමට නොහැකිවීම නිසා එකවර ලබාගත හැකි ජායාරූප සංඛ්‍යාව සීමිත වීම.
7. හදිසියකදී මෙමරි කාඩ්පත් සෑම තැනකින්ම ලබාගත නොහැකිවීම.

අන්තර්ගත කොට තිබෙනවා. මෙය(White Balance)යනුවෙන් හඳුන්වනවා. උදහරණයක් වශයෙන් සාමාන්‍ය කැමරාවකින් ප්‍රදිප්ත පහනක් (Flocresent Lamp)යටතේ ඡායරූපයක් ගතහොත් මුද්‍රණයෙන් පසු දක්නට ලැබෙන්නේ ලා කොළ පැහැයට හෝ කහ පැහැයට හුරු පාටක්ය. නමුත් ඉහත සඳහන් කළ වයිට් බැලන්ස් මගින් මෙම දෝෂය මත හරවා ගත හැකිය. බොහෝ කැමරාවල ඇත්තේ Auto White Balanceනමුත් උසස් තත්ත්වයේ කැමරාවල විවිධ ආලෝක තත්ත්වයන්ට සරිලන සේ වෙනස් කිරීමේ පහසුකම්ද සලසා තිබෙනවා.

ඔබ වෘත්තීය වශයෙන් ඡායාරූපකරනයේ යෙදෙන්නේනම් ඉහළ විභේදනයක් සහිත තරමක් විශාල කැමරාවක් තෝරා ගත යුතුවනවා මෙන්ම සාමාන්‍ය භාවිතයට නම් මධ්‍යම ප්‍රමාණයේ විභේදනත් සහිත සාක්කුවේ දමා ගතහැකි ආකාරයේ ප්‍රමාණයෙන් කුඩා කැමරාවක් තෝරා ගන්න.

එමෙන්ම කාචය ඉවත් කළ හැකි කැමරාවලද වෙනම "Flash"සවිකළ හැකි කැමරාවල ද මිල තරමක් ඉහළ නමුත් වෘත්තිය ඡායාරූප ශිල්පීන් අතර මේවා ජනප්‍රිය වී තිබෙනවා.

සෑම ඩිජිටල් කැමරාවකම ඕඩියෝ විඩියෝ පටිගත කිරීමේ පහසුකම් සලසා තිබෙනවා. නමුත් මෙයින් ගත හැක්කේ සමහර විට තත්පර කීපයක දර්ශන පමණකින් වන්නට පුළුවන. වැඩි පුර කාලයක් විඩියෝ ගත කිරීමේ පහසුකම් සහිත කැමරාවක් තෝරා ගැනීමට සැලකිලිමත්වන්න.මෙමරි කාඩ්පතේ ධාරිතාව වැඩිවෙන්ම එම ධාරිතාවයට සරිලන සේ එක දිගටම විඩියෝ ගත කිරීමේ පහසුකම් සහිත කැමරාද දැන් වෙළඳපොළේ දක්නට ලැබෙනවා.

අතින් නාභිගත කිරීමේ පහසුකම් සහිත මෙන්ම කාචවිවරය අවශ්‍ය පරිදි සැකසිය හැකි කැමරාද, කැමරාව තුළ අන්තර්ගතකොට ඇති චාජරය සහිතවද විවිධ විශේෂාංග අඩංගු කර ඇති කැමරාද ඇති අතර ඒවායේ මිලද ඉහළ මට්ටමක පවතී.

**යමකු ඩිජිටල් කැමරාවක් මිලදී ගැනීමට අදහස් කරන්නේ නම් ඔහුට දිය හැකි හොඳම අවවාදය කුමක්ද ?**

අනිවාර්යයෙන්ම කැමරාව මිලදී ගැනීමට පෙර එයින් ඡායාරූපයක් ගෙන මුද්‍රණය කර බලන්න. මෙමගින් ඔබටම කැමරාවේ .තත්ත්වය ගැන ස්වයං තීරණයක් ගත හැකි වෙනවා. ❑

**- මොහාන්**

**3. Mega Pixel**කැමරාවකින් විවිධ ධාරිතාවයන්ගෙන් යුත් මෙමරි කාඩ් භාවිතාකර විවිධ විභේදනයක් යටතේ ගත හැකි උපරිම ඡායාරූප සංඛ්‍යාව ගැන මෙම වගුව නිරීක්ෂණය කිරීමෙන් ඔබට යම් අවබෝධයක් ලබා ගත හැක.

| මෙමරි ධාරිතාව | ඉතා උසස් විභේදනය (2832 - 2128) | උසස් විභේදනය (2048 -1536) | සාමාන්‍ය විභේදනය (960 - 1280) | අවම විභේදනය 640 - 480) |
|---|---|---|---|---|
| 16 MB | 0 | 6 | 13 | 33 |
| 32MB | 1 | 13 | 28 | 68 |
| 64MB | 3 | 26 | 56 | 137 |
| 128MB | 7 | 53 | 113 | 275 |
| 340MB | 19 | 147 | 311 | 765 |
| 1000MB | 59 | 443 | 938 | 1290 |

# රස කතා

## තාත්වික චිත්‍රයක්

එක්තරා කලා ලැදි මිනිසකු හට ලොතරැයි දිනුමක් ඇදුණි. ඔහු මුදලින් හොඳ චිත්‍රයක් මිලදී ගැනීමට සිතා ගත්තේය.

"මට මේ චිත්‍ර ගැන එතරම් අවබෝධයක් නෑ," ඔහු චිත්‍ර අලෙවි කරන වෙළෙන්දාට කීවේ ය.

වෙළඳසැලේ කිසියම් කාමරයකට ඇතුළුවුණු වෙළෙන්ද විනාඩි කීපයකින් විශාල කැන්වස් චිත්‍රයක් ඔසවාගෙන එළියට ආවේය. කැන්වසය මැද තනි කළු තිතක් තිබුණි. මුළු චිත්‍රයම එපමණකි.

"මොකක්ද මේ චිත්‍රය?" මිනිසා ඇසුවේය.

"මෙක සම්භාව්‍ය ගණයේ චිත්‍රයක්," වෙළෙන්ද උත්තර දුන්නේය.

"මේ තනි තිතෙන් සංකේතවත් කරන්නේ දෙවියන්වහන්සේගේ ඒකීයත්වය සහ එතුමන්ගෙන් ලොවට ප්‍රකාශ වන විස්මිත ආදරය ගැනයි."

එකඟතාවකට පත්වුණු මිනිසා සෑහෙන මුදලකට චිත්‍රය මිලදී ගත්තේය. සති කීපයකට පසුව, හෙතෙම නැවතත් චිත්‍රයක් මිලදී ගැනීම පිණිස වෙළෙන්ද හමුවීමට පැමිණියේ ය.

"මිස්ට ස්මිත්, ඔබ ගිය මාසයේ මිලදී ගත් චිත්‍රයට වඩාත් සමීපවන චිත්‍රයක් මා ළඟ තියෙනවා."

වෙළෙන්ද මෙසේ පවසමින් ඇතුළට ගොස් විශාල කැන්වස් චිත්‍රයක් ඔසවාගෙන එළියට ආවේය. විශාල කැන්වසය මැද කළු තිත් දෙකක් තිබුණි. චිත්‍රය එපමණකි. "මේ චිත්‍රයේ තේරුම මොකක්ද?" මිනිසා ඇසුවේය.

"යාළුවා", වෙළෙන්ද පැවසුවේය. "මෙයින් සංකේතවත් වන්නේ සමීපත්වය. මේ ඉන්නේ ආදම් සහ ඒවා උපන් ඇඳුමින්ම. ඉතාමත් තාත්වික චිත්‍රයක් මෙතැන..."

"නවත්වනවා !" ස්මිත් කෑගැවේය. මේ චිත්‍රය නම් මට ගෙදර ගෙනියන්ට බෑ - අපේ ගෙදර ළමයි ඉන්නවා !"

රචනය - ආනෝල්ඩ් ෆයින්

## දෙයියෝ තමයි දන්නේ !

එක්තරා විශේෂඥ දෙස්තර මහතෙකු හට නවත් රෝහලක ලෙඩුන් පරීක්ෂා කිරීම ආරාධනාවක් ලැබුණි. ලෙඩාගේ රෝගය පිළිබඳ විස්තර ලියූ සටහන්වල රෝගයේ නම කෙටියෙන් ලිවීමට දෙස්තර මහතුන් උත්සුක වී තිබුණි. උණ සන්නිපාතයට උ.ස. යනුවෙන් ද, ගලපටල රෝගයට ග.රෝ. යනුවෙන් ද, ඇපෙන්ඩි සයිටික්ස් රෝගයට ඇ.ස. යනුවෙන්ද යොදා ඇති බව ඔහුට හඳුනා ගැනීමට හැකි විය. එක්තරා සටහනක දෙ.ත.ද. යනුවෙන් සටහන් කර තිබුණි. දෙස්තර මහතාට එය හඳුනා ගැනීමට නොහැකි වුණි.

"මොකක් මේ දෙ.ත.ද. කියන රෝගය?" හෙතෙම ඇසුවේය.

"දෙයියෝ තමයි දන්නේ ! "

රචනය :- නෝටන් ලෙවිට්ස්

## අමතකවීම

තඩුකාරයා :- ඔබ මේ ස්ත්‍රියට යක්ෂණී, පෙරේතී, බොරුකාරී කියලා පරුෂ වචනයෙන් බැන්නා ද?

මිනිසා :- එහෙමයි ස්වාමිනි

තඩුකාරයා :- හැතිරී කියලා කිව්වේ නැද්ද?

මිනිසා :- අයියෝ නෑ, ඒ වචනය මට අමතක වුණා !

රචනය :- එච්.එන්. මීලා

**අනුවාදය :-**

**පරාක්‍රම ඇස්. විජේවර්ධන**